# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1939/4 - 2015 නොවැම්බර් මස 02 වැනි සඳුදා - 2015.11.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/51 (IX).

**මෝටර් වාහන පනත (203 වන අධිකාරය)**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 122 වන වගන්තිය සහ VII අ කොටස සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් පනවනු ලබන නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

මේ නියෝග 2015 අංක 1 දරන මෝටර් වාහන (රියදුරු පාසල්, රියදුරු උපදේශක සහ සහකාර රියදුරු උපදේශක) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර එම නියෝග.

(*අ*) අලුත් රියදුරු පාසැල් සම්බන්ධයෙන් වන විට, ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට බලාත්මක විය යුතුය ; සහ

(*ආ*) පවත්නා රියදුරු පාසැල් සම්බන්ධයෙන් වන විට, 2017 ජනවාරි 1 වන දින සිට බලාත්මක විය යුතු ය.

**1 වන කොටස**

***රියදුරු පාසල්***

1. සෑම රියදුරු පාසලක ම (මෙහි මින් මතු ''කොමසාරිස් ජනරාල්'' යනුවෙන් සඳහන් කරනු ලබන) මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

2. සෑම රියදුරු පාසලක් ම 9 වන ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතියට අනුව ''ඒ'', ''බී'' සහ ''සී'' වශයෙන් ප්‍රභේදගත කරනු ලැබිය යුතු ය.


1A - PG 2667 — 506 (2015/11)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. රියදුරු පාසලක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කරනු ලබන සෑම තැනැත්තකු ම -

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය ;

(ආ) යටත් පිරිසෙයින් වයස අවුරුදු 25 ක් විය යුතු ය ;

(ඇ) රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක් තුළ රියදුරු පුහුණු කිරීමේ කාර්‍යයේ යෙදී සිටින තැනැත්තකු හැර, එවැනි ආයතනයක සේවා නියුක්තිකයකු නොවිය යුතු ය ;

(ඈ) පහත සඳහන් පහසුකම් සහිත ගොඩනැගිල්ලක පිහිටි ස්ථිර කාර්යාලයක් පවත්වාගෙන යා යුතු ය ; එනම් -

(i) මෝටර් වාහනයක ආදර්ශ පද්ධතියක් ප්‍රදර්ශනය කිරීමක් සහිතව දේශන පැවැත්වීම සඳහා පහසුකම් ;

(ii) කාර්මික පුහුණුව සඳහා පහසුකම් ; සහ

(iii) වාහන නැවැත්වීමට ඉඩකඩ ;

(ඉ) I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුව පුහුණුව ලබන්නන්ගෙන් පාඨමාලාව සඳහා අයකරනු ලබන ගාස්තු සහ පුහුණුවට අදළ රීති හා කොන්දේසි පෙන්නුම් කරනු ලබන නිවේදන ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය ;

(ඊ) ඉල්ලුම් කිරීමට පෙරාතුව එම ආයතනය, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබුව ද එය නොතකා, ව්‍යාපාරික ව්‍යවසායක් වශයෙන් අදළ පළාත් පාලන ආයතනයේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය ; සහ

(උ) පුහුණුව පැවැත්වීම සඳහා බලපත්‍රලත් රියදුරු උපදේශකවරුන් හෝ සහකාර රියදුරු උපදේශකවරුන් පමණක් සේවයේ නියුක්ත කරනු ලැබිය යුතු ය.

4. (1) 9 වන නියෝගය යටතේ නිශ්චිත ප්‍රභේදයට අදළ වන ප්‍රමිති සම්පූර්ණ කරන ලද සෑම රියදුරු පාසලක් ම කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. රියදුරු පාසල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අදහස් කරන සෑම තැනැත්තෙකු ම මෙම නියෝගවල II වන උපලේඛනයේ දක්වා ඇති පරිදි කොමසාරිස් ජනරාල් වෙත අයදුම් පත්‍රයක් භාර දීම මගින් රියදුරු පාසල් බලපත්‍රයක් සඳහා අයදුම් කළ යුතු ය.

(2) ඒ, බී. සහ සී ලෙස ප්‍රභේදගත කරන ලද රියදුරු පාසල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම සඳහා වන බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලබන සෑම ඉල්ලුම්කරුවකු විසින් ම, පහත සඳහන් ලියාපදිංචි ගාස්තු කොමසාරිස් ජනරාල් වෙත ගෙවනු ලැබිය යුතු ය.-

(අ) ඒ ප්‍රභේදය - රු. 20,000/-

(ආ) බී ප්‍රභේදය - රු. 15,000/-

(ඇ) සී ප්‍රභේදය - රු. 10,000/-

(3) කොමසාරිස් ජනරාල් විසින් රියදුරු පාසල් බලපත්‍ර ලබා ගැනීම සඳහා වන සියලු ඉල්ලුම්පත්‍ර සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම මණ්ඩලයේ නිර්දේශය මත රියදුරු පාසල් වර්ගීකරනය කරනු ලැබිය යුතු ය. සමාලෝචන මණ්ඩලය විසින් එක් එක් ප්‍රභේදයට අවශ්‍ය රියදුරු උපදේශකවරුන් සංඛ්‍යාව නිශ්චය කිරීමේ දී සහකාර රියදුරු උපදේශකවරුන් රියදුරු උපදේශකවරුන් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

5. (1) යම් ඉල්ලුම්කරුවකු හට බලපත්‍රය ලබා දුන් විට, එම ඉල්ලුම්කරු විසින් වසර දෙකක කාලයක් සඳහා වන සහ ඉන් පසු සෑම වසර දෙකකට වරක් අලුත් කළ යුතු වන, පහත සඳහන් බලපත්‍ර ගාස්තු ගෙවනු ලැබිය යුතු ය.

(අ) ඒ ප්‍රභේදය - රු. 10,000/-

(ආ) බී ප්‍රභේදය - රු. 7,500/-

(ඇ) සී ප්‍රභේදය - රු. 5,000/-

(2) බලපත්‍රය අවසන් වීමට දින තිහකට අඩු නොවන කාලයක් තුළ දී, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මගින් බලපත්‍රය අලුත් කරනු ලැබිය හැකි ය. නිශ්චිත කාල සීමාව ඇතුළත රියදුරු පාසැල් බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක දී, දඩවලට අතිරේකව ප්‍රමාද වූ එක් එක් මාසය සඳහා ඉහත සඳහන් ප්‍රභේද සඳහා පිළිවෙලින් රු. 500, රු. 375 සහ රු. 250 වන දණ්ඩන මුදලක් අය කරනු ලැබිය යුතු ය.

(3) බලපත්‍රය අලුත් කිරීමක් වශයෙන්, කොමසාරිස් ජනරාල්වරයාගේ පිටසන් කිරීමක් මගින්, නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අලුත් කරනු ලැබිය හැකි ය.

6. රියදුරු පාසැල් පිළිබඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන තැනැත්තකු විසින් -

(අ) අදළ රියදුරු පාසලේ යම් වෙනස්කම් පිළිබඳව එක් සතියක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය ;

(ආ) පුහුණුව ලබන්නන්ගෙන් ලැබෙන ගාස්තු සඳහා රිසිට්පතක් නිකුත් කරනු ලැබ එම රිසිට්පත් වල අනු පිටපත් හෝ පිලිපත් ළඟ තබාගත යුතු ය ;

(ඇ) රියදුරු පාසලට අදාළ යම් ලිපිලේඛන, නිවේදන හෝ දැන්වීම් සඳහා රියදුරු පාසලේ බලපත්‍ර අංකය ඇතුළත් කළ යුතු ය ;

(ඈ) නොමග යවනසුළු හෝ මුලා කරන ස්වභාවයේ යම් නිවේදන හෝ ප්‍රචාරණ දැන්වීම් නිකුත් කිරීම හෝ පළකිරීම නොකළ යුතු ය ;

(ඉ) නිවේදන පළකිරීම හා වෙළඳ දැන්වීම් මුද්‍රණය සඳහා කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අනුමතය ලබා ගත යුතු ය ;

(ඊ) වලංගු රියදුරු උපදේශක බලපත්‍රයක් සන්තකයේ නොමැති පුද්ගලයෙකු කිසිදු රියදුරු උපදේශකවරයකු වශයෙන් හෝ සහකාර රියදුරු උපදේශකවරයකු වශයෙන් සේවයේ නොයෙදවිය යුතු ය ;

(උ) යෝග්‍යතා සහතිකයක් නිකුත් කර ඇති සහ පුහුණුවීමේ කාර්යය සඳහා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති වාහනයක් පමණක් භාවිත කරනු ලැබිය යුතු ය ;

(ඌ) කිසිදු දූරාචාර ක්‍රියාවක හෝ අක්‍රමිකතාවක යෙදවීම හෝ උපදේශකවරුන්ට අවසර නොදිය යුතු ය ;

(එ) වාර්තා, රෙජිස්ටර, පොත් සහ ගිණුම් නිසි ලෙස පවත්වාගෙන යාම පිළිබඳ වගකිව යුතු ය ;

(ඒ) මේ නියෝග යටතේ අවශ්‍ය වන ගාස්තු සහ අය කිරීම්වලට අදාළ සියලු ගෙවීම් සිදු කළ යුතු ය ;

(ඔ) මේ නියෝගවල යම් විධිවිධානයක් අනුගමනය කරනු නොලැබූවහොත්, යම් ලිඛිත නීතියක් යටතේ පුද්ගලිකව බැඳී සිටිය යුතු ය.

7. සෑම රියදුරු පාසැලකම පහත දැක්වෙන කරුණු ඇතුළත් රෙජිස්ටරයක් පවත්වාගන යා යුතු ය -

(අ) පුහුණුව ලබන්නන්ගේ නම්, ලිපිනය, සහ වයස ;

(ආ) ලියාපදිංචිවීමේ දිනය ;

(ඇ) පුහුණු කිරීමේ සැසිවාරය ආරම්භ වන දිනය, රිය පුහුණුව ආරම්භ කළ වේලාව, ධාවනය කළ කිලෝමීටර් ගණන, රිය පුහුණුව අවසන් කළ වේලාව, කාර්මික දැනුම, ආචාර ධර්ම, මාර්ග සංඥා සහ මාර්ග රීති සම්බන්ධ න්‍යායික පුහුණුව පිළිබඳ දේශන සඳහා ගත කළ පැය ගණන

(ඈ) උපදේශකවරුන්ගේ නම් ; සහ

(ඉ) වාහන අංක.

8. පුහුණු පාඨමාලාව අවසන් කිරීමෙන් පසුව, රියදුරු බලපත්‍රයක් ලබාගැනීම සඳහා වූ ප්‍රායෝගික පරීක්ෂණයේ දී, එම ඉල්ලුම්පත්‍රය සමග ඇමිණීමට පුහුණුව ලබන්නා හට හැකිවන පරිදි පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට ප්‍රකාශ කරමින් රියදුරු පාසල විසින් පුහුණුව ලබන්නා වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

9. සෑම රියදුරු පාසලක් ම ''ඒ'', ''බී'' සහ ''සී'' ලෙස ප්‍රභේදගත කරනු ලැබිය යුතු අතර එම රියදුරු පාසල් විසින් පහත දැක්වෙන ප්‍රමිතීන් අනුව පවත්වාගෙන යෑමට අවශ්‍ය වේ :-

| එක් එක් රියදුරු පාසල් ප්‍රභේද සඳහා වූ අවම ප්‍රමිතිය | | | |
|---|---|---|---|
| විස්තරය | ''ඒ'' ප්‍රභේදය | ''බී'' ප්‍රභේදය | ''සී'' ප්‍රභේදය |
| 1. වාහන වර්ගය<br>(අ) බර වාහන | (i) බර මෝටර් ලොරියක් හෝ බර මෝටර් කෝච් රථයක්<br>(ii) මෝටර් කෝච් රථයක් | (i) මෝටර් ලොරියක් හෝ මෝටර් කෝච් රථයක් | අවශ්‍ය නොවේ. |
| (ආ) සැහැල්ලු වාහන | මෝටර් රථයක් හෝ ද්විත්ව කාර්යය වාහනයක් | මෝටර් රථයක් හෝ ද්විත්ව කාර්යය වාහනයක් | මෝටර් රථයක් හෝ ද්විත්ව කාර්යය වාහනයක් |
| (ඇ) මෝටර් ට්‍රයිසිකල් | එකක් | එකක් | එකක් |
| (ඈ) ක්ලච් පාලනයක් සහිත ධාරිතාව 100 cc අඩු මෝටර් බයිසිකල් | එකක් | එකක් | එකක් |
| (ඉ) ක්ලච් පාලනයක් සහිත ධාරිතාව 100 cc වැඩි මෝටර් බයිසිකල් | එකක් | එකක් | එකක් |
| 2. බලපත්‍රලාභී රියදුරු උපදේශකවරුන් - | | | රියදුරු ශ්‍රේණි තුනෙන් යටත් පිරිසෙයින් එක් රියදුරු උපදේශකවරයකු |
| (අ) ''ඒ'' පංතියේ බලපත්‍රලාභී රියදුරු උපදේශකවරයකු. | අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු | අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු | |
| (ආ) ''බී'' පංතියේ බලපත්‍රලාභී රියදුරු උපදේශකවරයකු. | අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු | අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු | |
| (ඇ) ''සී'' පංතියේ බලපත්‍රලාභී රියදුරු උපදේශකවරයකු. | අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු | අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු | |
| 3. රථවාහන තාක්ෂණවේදය, ආචාර ධර්ම, මනෝවිද්‍යාව සහ ප්‍රථමාධාර යන ක්ෂේත්‍රවල සුදුසුකම්ලත් දේශකයින් යෙදවිය යුතු ය. | එක් එක් ක්ෂේත්‍රයෙන් එක් දේශකයකු | එක් එක් ක්ෂේත්‍රයෙන් එක් දේශකයකු | එක් එක් ක්ෂේත්‍රයෙන් එක් දේශකයකු |
| 4. කාර්යාලය සහ පංති කාමර පහසුකම් ඇතුළුව සියලු අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය අවම ඉඩකඩ (සියලු අවශ්‍යතා එකම පරිශ්‍රය තුළ විය යුතු ය.) | වර්ග මීටර 35 | වර්ග මීටර 30 | වර්ග මීටර 15 |

| එක් එක් රියදුරු පාසල් ප්‍රභේද සඳහා වූ අවම ප්‍රමිතිය | | | |
|---|---|---|---|
| විස්තරය | ''ඒ'' ප්‍රභේදය | ''බී'' ප්‍රභේදය | ''සී'' ප්‍රභේදය |
| 5. මාර්ග සංඥා සහ මෝටර් වාහනයක පාලනය පිළිබඳ පුහුණුව ලබා දීම සහ සියලු සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම සහ පංති කාමරයක ශිෂ්‍යයන්ට පැහැදිලිව පෙන්නුම් කිරීමට වාහන ආලෝක පද්ධතියක් සහිත ආදර්ශයක් තබා ගත යුතු ය. | පැවතිය යුතු අතර, සියලු අවස්ථා වලදී ප්‍රදර්ශනය කළ යුතු ය. | පැවතිය යුතු අතර, සියලු අවස්ථාවල දී ප්‍රදර්ශනය කළ යුතු ය. | පැවතිය යුතු අතර, සියලු අවස්ථාවල දී ප්‍රදර්ශනය කළ යුතුය. |
| 6. ආචාර ධර්ම, මනෝවිද්‍යාව, ප්‍රථමාධාර සහ මෝටර්රථ කාර්මික ශිල්පය යන විෂයයන් ඉගැන්වීම සඳහාත් පාද සහ අත් තිරිංග, සුක්කානම, සම්ප්‍රේෂණ, පවර්ට්‍රේන් සහ ඉදිරිපස රෝදය පසුපස රෝදය සහ අවලම්භනය ඇතුළු මෝටර් වාහනයක ප්‍රධාන කොටස් පිළිබඳව ඉගැන්වීම සඳහාත් යෝග්‍ය පංති කාමරයක් තිබිය යුතු ය. | පැවතිය යුතු අතර, සියලු අවස්ථා වලදී ප්‍රදර්ශනය කළ යුතු ය. | පැවතිය යුතු අතර, සියලු අවස්ථාවල දී ප්‍රදර්ශනය කළ යුතු ය. | පැවතිය යුතු අතර, සියලු අවස්ථාවල දී ප්‍රදර්ශනය කළ යුතුය. |
| 7. කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන සියලු වාර්තා සහ රෙජිස්ටර් සමග කාර්යාලයක් පවත්වා ගෙන යා යුතු ය. | පවත්වා ගෙන යා යුතු අතර අවශ්‍ය අවස්ථාවල දී ඉදිරිපත් කළ යුතු ය. | පවතවා ගෙන යා යුතු අතර අවශ්‍ය අවස්ථාවල දී ඉදිරිපත් කළ යුතු ය. | පවත්වා ගෙන යා යුතු අවශ්‍ය අවස්ථාවල දී ඉදිරිපත් කළ යුතුය. |

10. ''ඒ'' ප්‍රභේදයට අයත් යම් රියදුරු පාසලක් විසින් අදාළ වාහනයේ අයිතිකරු සමග ගිවිසුමක් හෝ කොන්ත්‍රාත්තුවක් අත්සන් කිරීමෙන් පසුව පුහුණුවීමේ කාර්ය සඳහා බර මෝටර් ලොරියක් හෝ බර මෝටර් කෝච් රථයක් කුලියට හෝ ණයට ලබා ගත හැකිය. පුහුණු වීමේ කාර්ය සඳහා එම වාහනය භාවිත කිරීමට අදාළ කොන්දේසි කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු අතර, එම කොන්දේසි එකී ගිවිසුමේ හෝ කොන්ත්‍රාත්තුවේ ඇතුළත් කරනු ලැබිය යුතු ය.

11. (1) යම් නිශ්චිත ප්‍රභේදයක රියදුරු පාසල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන තැනැත්තෙකු විසින් එම රියදුරු පාසල් බලපත්‍රයේ ප්‍රභේදය වෙනස් කිරීම සඳහා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවැනි කාර්යයක් සඳහා රු. 4000/- ක සැකසුම් ගාස්තුවක් ඉල්ලීම කරනු ලබන අවස්ථාවේ දී ගෙවනු ලැබිය යුතු ය.

(2) රියදුරු පාසල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන තැනැත්තෙකු විසින්, එක් එක් අතිරේක ස්ථාන සඳහා ඉල්ලුම්පත්‍රයක්, එම අතිරේක ස්ථාන ලියාපදිංචි කිරීම සඳහා ගාස්තුව ගෙවන ලද රිසිට්පත සමග ඉදිරිපත් කිරීම මගින්, එකම නම යටතේ එක් ස්ථානයකට වඩා වැඩි ස්ථාන ප්‍රමාණයක රියදුරු පාසල් පවත්වාගෙන යා හැකි ය.

12. රියදුරු පාසල් ප්‍රභේදයන් මගින් පුහුණුව ලබා දිය යුතු වාහන පංති පහත දැක්වෙන පරිදි වේ :-

| | වාහන පංතිය | පුහුණුව ලබා දෙන රියදුරු පාසල් ප්‍රභේද |
|---|---|---|
| 1 | මෝටර් සයිකල් | ඒ, බී, සී |
| 2 | සැහැල්ලු මෝටර් සයිකල් | ඒ, බී, සී |
| 3 | මෝටර් රථ | ඒ, බී, සී |
| 4 | ද්විත්ව කාර්ය මෝටර් වාහන | ඒ, බී, සී |
| 5 | මෝටර් ට්‍රයිසිකල් | ඒ, බී, සී |
| 6 | මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ | ඒ, බී, සී |
| 7 | මෝටර් ලොරි | ඒ, බී |
| 8 | සැහැල්ලු මෝටර් ලොරි | ඒ, බී |
| 9 | බර මෝටර් ලොරි | ඒ, |
| 10 | මෝටර් කෝච් රථ | ඒ, බී |
| 11 | සැහැල්ලු මෝටර් කෝච් රථ | ඒ, බී |
| 12 | බර මෝටර් කෝච් රථ | ඒ |
| 13 | ඉඩම් වාහන | ඒ, බී, සී |
| 14 | අත් ට්‍රැක්ටර් | ඒ, බී, සී |
| 15 | විශේෂ කාර්ය වාහන | ඒ, බී |

## II වන කොටස

*රියදුරු උපදේශකවරු සහ සහකාර රියදුරු උපදේශකවරු*

13. ''ඒ'', ''බී'', ''සී'' ලෙස වර්ගීකරණය කරන ලද රියදුරු උපදේශක පංති තුනක් මෙන්ම එක් සහකාර රියදුරු උපදේශක පංතියක් තිබිය යුතු ය.

14. රියදුරු උපදේශකවරයකු හෝ සහකාර රියදුරු උපදේශකවරයකු වශයෙන් ක්‍රියා කිරීම සඳහා වන බලපත්‍රයක් සඳහා ඉල්ලම්කරනු ලබන සෑම තැනැත්තකුම -

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය ;

(ආ) වයස අවුරුදු 23 ට නොඅඩු හා අවුරුදු 65 ට නොවැඩි අය විය යුතු ය.

එසේ වුව ද, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන වෙනත් යම් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක වෛද්‍ය නිලධරයකු විසින් නිකුත් කරනු ලබන විශේෂ වෛද්‍ය සහතිකයක් සැලකිල්ලට ගැනීමෙන් පසුව රියදුරු උපදේශකයකු හෝ සහකාර රියදුරු උපදේශකයකු සඳහා වන බලපත්‍රයක අලුත් කිරීමක් සඳහා වයස අවුරුදු 70 දක්වා දීර්ඝ කිරීමක් ලබා දිය හැකි ය ; සහ

(ඇ) තමා ඉල්ලුම්කරනු ලබන අදාළ පංතිය සඳහා ඉල්ලීම් කිරීමේ දිනයට පෙරාතුව යටත් පිරිසෙයින් අවුරුදු පහකට පෙර ලබා ගත්, අවම අවශ්‍යතාව වශයෙන් පහත නිශ්චිතව දක්වා ඇති එක් එක් පංතිය වෙනුවෙන් වූ රියදුරු බලපත්‍රයක් සන්තකයේ තිබිය යුතු ය. එනම් :-

(i) ''ඒ'' පංතියේ රියදුරු උපදේශක -
''ඩීඊ'' හෝ ''සීඊ'' සහ ''ඒ'' පංති සඳහා රියදුරු බලපත්‍රය.

(ii) ''බී'' පංතියේ රියදුරු උපදේශක
''ඩී'' හෝ ''සී'' සහ ''ඒ'' පංති සඳහා රියදුරු බලපත්‍රය.

(iii) ''සී'' පංතියේ රියදුරු උපදේශක -
''බී'', ''බී1'' සහ ''ඒ'' පංති සඳහා රියදුරු බලපත්‍රය.

(iv) සහකාර රියදුරු උපදේශක -
''බී'', ''බී1'' සහ ''ඒ'' පංති සඳහා රියදුරු බලපත්‍රය.

(ඈ) රාජ්‍ය ආයතනයක හෝ අධි රාජ්‍ය ආයතනයක හෝ වෙනත් එවැනි ආයතනයක පුහුණු කිරීමේ කාර්යයේ යෙදී සිටින තැනැත්තෙකු හැර ඔහු හෝ ඇය එවැනි ආයතනයක සේවා නියුක්තිකයෙකු නොවිය යුතු ය.

15. (අ) රියදුරු උපදේශක බලපත්‍රයක් හෝ සහකාර රියදුරු උපදේශක බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම මෙම නියෝගවල III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) රියදුරු උපදේශක බලපත්‍රයක් හෝ සහකාර රියදුරු උපදේශක බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රයක් ලබා ගැනීම සඳහා කොමසාරිස් ජනරාල් වෙත රු. 2000/- ක ඉල්ලුම් පත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු ය.

16. (අ) රියදුරු උපදේශක බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරනු ලබන යම් තැනැත්තකු අ.පො.ස. (සා.පෙළ) සම්මාන සාමාර්ථ 2 ක් සහිතව භාෂාව ගණිතය ඇතුළු විෂයන් 6කින් එකවර හෝ සමාන විභාගයක් සමත්ව තිබිය යුතු අතර -

(i) සහකාර රියදුරු උපදේශකවරයකු වශයෙන් අයදුම් කරන දිනයට පෙර වසර පහක පළපුරුද්දක් ; හෝ

(ii) වසර පහක පළපුරුද්දක් සහ තමා උපදේශකවරයකු වශයෙන් අයදුම් කරනු ලබන පංතියට අයත් වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක්,

තිබිය යුතු ය.

(ආ) සහකාර රියදුරු උපදේශක බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරනු ලබන යම් තැනැත්තකු -

(i) අට වන ශ්‍රේණියට සුදුසුකම් ලැබීමේ විභාගය හෝ සමාන විභාගයක් සමත් විය යුතු ය ; සහ

(ii) රියදුරු පාසලක සේවා නියුක්තිකයකු වශයෙන් අවුරුදු තුනක පළපුරුද්දක් තිබිය යුතු අතර ඒ පිළිබඳ සේවක අර්ථසාධක අරමුදල් අංකය (EPF) සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් අංකය (ETF) ඇතුළත් වන ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

එසේ වුව ද, මෙම නියෝග ප්‍රසිද්ධ කරනු ලබන දින සිට එක් අවුරුදු කාලයක් සඳහා සේවක අර්ථ සාධක අරමුදල් අංකය (EPF) සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් අංකය (ETF) ඇතුළත්වන ලේඛන අවශ්‍ය නොවේ.

17. සෑම රියදුරු උපදේශකයකු සහ සහකාර රියදුරු උපදේශකයකු ම -

(අ) විභාග දෙපාර්තමේන්තුව විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන රියදුරු උපදේශක හෝ සහකාර රියදුරු උපදේශක විභාග සමත් විය යුතු ය. විභාග පිළිබඳ තොරතුරු රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රවෘත්ති පත්‍රවල පළ කරනු ලැබිය යුතු ය ;

(ආ) එම තැනැත්තා හට මෝටර් වාහන පනත, මාර්ග නීති, මහා මාර්ග සංග්‍රහය, ඉගැන්වීමේ සහ උපදේශ දීමේ ක්‍රමවේද, ආරක්ෂිතව රියපැදවීම, ආචාරධර්ම, ප්‍රථමාධාර, කාර්මික සහ තාක්ෂණික දැනුම මෙන්ම මාර්ග ආරක්ෂාව පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් සෑහීමට පත්විය යුතු ය ;

(ඇ) කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය සමත් විය යුතු ය ;

(ඈ) කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන රියදුරු උපදේශක පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

18. ඉහත 16 වන නියෝගයේ නිශ්චිතව සඳහන් අවශ්‍යතා සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, සෑම රියදුරු උපදේශකයකු හෝ සහකාර රියදුරු උපදේශකයකු විසින් ම -

(අ) වසර දෙකක් සඳහා අදාළ වන බලපත්‍ර ගාස්තුවක් පහත සඳහන් ආකාරයට ගෙවිය යුතු ය -

(i) රියදුරු උපදේශක - රු. 6000/-

(ii) සහකාර රියදුරු උපදේශක - රු. 4,000/-

(ආ) බලපත්‍රය නිකුත් කර ඇති සෑම පංතියකටම අයත් වාහන පැදවීම සඳහා එම උපදේශකවරයාගේ යෝග්‍යතාව තීරණය කිරීමට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් ලබා දෙන වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(ඇ) තමාගේ ලිපිනය වෙනස්වීමක් සිදුවන අවස්ථාවක දී ඒ පිළිබඳව එවැනි වෙනස් වීමකින් එක් සතියක කාලයක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු ය ;

(ඈ) ස්වකීය ව්‍යාපාරයට අදාළ සෑම ලිපි හුවමාරුවක්, ඉල්ලීමක්, නිවේදනයක් හෝ ප්‍රචාරක දැන්වීමක් සඳහාම ස්වකීය උපදේශක බලපත්‍ර අංකය ඇතුළත් කළ යුතු ය ; සහ

(ඉ) කිසිදු නිවේදනයක හෝ ප්‍රචාරක දැන්වීමක අසත්‍ය හෝ නොමග යවන සුලු ප්‍රකාශන සිදු නොකළ යුතු ය.

19. මෙම නියෝගවල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා පිළිබඳ සෑහීමකට පත් වීම මත කොමසාරිස් ජනරාල්වරයා විසින් වසර දෙකක කාලසීමාවක් සඳහා රියදුරු උපදේශක බලපත්‍රය හෝ සහකාර රියදුරු උපදේශක බලපත්‍රය නිකුත් කරනු ලැබිය යුතු ය.

20. (1) බලපත්‍රය කල් ඉකුත් වීමට මාස තුනකට නො අඩු කාලයක් ඇතුළත, මෙම නියෝගවල III වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් කොමසාරිස් ජනරාල් වෙත කරනු ලබන ඉල්ලීමක් මගින්, සෑම රියදුරු උපදේශක බලපත්‍රයක් හෝ සහකාර රියදුරු උපදේශක බලපත්‍රයක් ම සෑම එළඹෙන වසර දෙකක දී ම අලුත් කරනු ලැබිය යුතු ය. ඉල්ලුම්පත්‍රය ලැබීමෙන් පසු කොමසාරිස් ජනරාල් විසින් රියදුරු උපදේශක හෝ සහකාර රියදුරු උපදේශක පරීක්ෂණයට සහ විභාගයට භාජනය කරනු ලැබිය යුතු අතර, ඉන් සෑහීමට පත් පසු රියදුරු උපදේශකට හෝ සහකාර රියදුරු උපදේශකට අලුත් කිරීමේ ගාස්තුව ගෙවන ලෙස උපදෙස් දිය යුතු ය. නිශ්චිත කාලසීමාව තුළ බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, වෙනත් යම් දඩ මුදලකට අතිරේකව රු. 275/- සහ රු. 200/- බැගින් පිළිවෙලින් එක් එක් මාසය සඳහා දඩ මුදලක් අය කරනු ලැබිය යුතු ය.

(2) 18 (අ) නියෝගය යටතේ බලපත්‍ර ගාස්තුව බලපත්‍රය අලුත් කරන අවස්ථාවේ දී අදාළ විය යුතු ය.

## **III** කොටස

### *සාමාන්‍ය විධිවිධාන*

21. පුහුණුවීමේ කාර්ය සඳහා රියදුරු උපදේශකවරුන් හෝ සහකාර රියදුරු උපදේශකවරුන් විසින් භාවිත කරනු ලබන සෑම වාහනයක් ම -

(අ) ආරම්භයේ දී පරීක්ෂාකර සහතික කරනු ලැබිය යුතු අතර ඉන් පසුව සෑම මාස හයකට වරක් ම හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය පවරනු ලබන නිලධරයකු විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක දී එසේ පරීක්ෂාකර සහතික කරවා ගනු ලැබිය යුතු ය ;

(ආ) දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ස්ටිකරයක් අලවා තිබිය යුතු ය ;

(ඇ) රියදුරු පුහුණුව සඳහා භාවිතා කරනු ලබන වාහනයක් වශයෙන් (පූර්ණ රක්ෂණාවරණයක් යටතේ) රක්ෂණය කරනු ලැබිය යුතු ය ;

(ඈ) මෝටර් වාහන පනතේ 123 (2) (ආ) (iii) වන වගන්තිය ප්‍රකාරව රතු පැහැයෙන් අවශ්‍ය ප්‍රමාණයට අනුව ඇති ඉංග්‍රීසි ''එල්'' (L) අක්ෂරය සුදු පැහැති තහඩුවක් මත සඳහන් කර වාහනයේ සවිකර තිබිය යුතු ය.

22. කොමසාරිස් ජනරාල්වරයා විසින් අවශ්‍ය බව සලකනු ලබන යම් විමර්ශනයක් පැවැත්වීමෙන් පසුව, මෝටර් වාහන පනත යටතේ හෝ මෝටර් වාහන පනත යටතේ සාදනු ලබන මේ නියෝගය හෝ වෙනත් යම් නියෝගවල සඳහන් අවශ්‍යතා වලට අනුකූලව ක්‍රියා නොකිරීමේ හේතුවෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් රියදුරු පාසලක හෝ රියදුරු උපදේශකයකුගේ හෝ සහකාර රියදුරු උපදේශකයකුගේ බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.

## **IV** කොටස

### *පුහුණුව සඳහා නියමිත විෂය නිර්දේශය*

23. සෑම රියදුරු පාසලක රියදුරු උපදේශකයකු හෝ සහකාර රියදුරු උපදේශකයකු විසින් ම පහත දැක්වෙන විෂය නිර්දේශය සහ විස්තර වලට අනුකූලව පුහුණුවීම් පවත්වනු ලැබිය යුතු ය -

අ. දේශන හා ප්‍රායෝගික පාඩම් ඇතුළත් වන කාර්මික දැනීම

(අ) දේශන පහත සඳහන් කරුණු මත පදනම් විය යුතු ය :-

(i) මෝටර් වාහනයක් මෙහෙයවීමේ මූලික සිද්ධාන්ත ;

(ii) වැසි, එන්ජිම, ගියර්, සම්ප්‍රේෂණ, අවලම්භනය, සුක්කානම, තිරිංග, ටයර් ආදිය මෙන්ම ඒවා ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ මූලික දැනුම ;

(iii) සුක්කානම, ක්ලච්, තිරිංග සහ ඇක්සලරේටරය ක්‍රියාත්මක වීමේ ක්‍රම වේදය ;

(iv) ලිස්සා යෑමේ අනතුරු, ලිස්සායෑම වැළැක්වීමේ ක්‍රම සහ එවැනි අවස්ථාවල දී ගනු ලැබිය යුතු ප්‍රතිකර්ම පියවර ; සහ

(v) වැසි කාලගුණයක් සහ මීදුම් සහිත අවස්ථාවල දී රිය පැදවීම.

(ආ) ප්‍රායෝගික පාඩම් :- භාවිතයට ගත නොහැකි වාහනයක කොටස් ගලවා එමගින් ඉහත සඳහන් වාහන කොටස් වල ක්‍රියාකාරීත්වය ප්‍රදර්ශනය කිරීම.

දේශන හා ප්‍රායෝගික පුහුණුව සඳහා පැය හයක අවම කාලයක් සපයනු ලැබිය යුතු ය.

ආ. මාර්ග රීති සහ මාර්ග සංඥා

දේශන පහත සඳහන් කරුණු මත පදනම් විය යුතු ය :-

(i) හස්ත සංඥා සහ විද්‍යුත් සංඥා ;

(ii) රියදුරෙකුගේ වගකීම් සහ කාර්යයන් ;

(iii) මහා මාර්ග සංග්‍රහයේ අන්තර්ගත මාර්ග සංඥා සහ සංඥා පිළිබඳ නියෝග ;

(iv) පසුපස බලන කණ්නාඩියේ නිවැරදි භාවිතය හා සංඥා භාවිතය ;

(v) වාහනයක් පාලනය කිරීමේ උසස් මට්ටමේ හැකියාව, මාර්ග රීති පිළිපැදීම පිළිබඳ දැනුවත් කිරීම, මාර්ග භාවිත කරන වෙනත් තැනැත්තන් පිළිබඳ ඉවසීම සහ සලකා බැලීම ;

(vi) නිවැරදි අවස්ථාවේ දී නිවැරදි ලෙස, නිරවද්‍ය ලෙස සහ පමා නොවී සංඥා නිකුත් කිරීමේ ප්‍රයෝජනය ;

(vii) මාර්ග භාවිතා කරන වෙනත් තැනැත්තන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ පූර්වාපේක්ෂාව ඒ සඳහා උචිත පියවර ගැනීම ;

(viii) විඩාවට පත් වීම, මත්ද්‍රව්‍ය සහ මද්‍යසාර රියදුරන්ට බලපාන අන්දම.

ඉහත සඳහන් මාතෘකා පිළිබඳ දේශන පැවැත්වීම සඳහා අවම වශයෙන් පැය දෙකක කාලයක් ලබා දිය යුතු ය.

ඇ. ප්‍රායෝගික පුහුණුව

ප්‍රායෝගික පුහුණුව පහත දැක්වෙන කරුණු මත පදනම් විය යුතු ය :-

(අ) රිය පැදවීමේ ආචාරධර්ම, ආතතිකාරී අවස්ථාවන් හමුවේ ප්‍රකෘති මානසිකත්වය පාලනය කිරීම, මාර්ගයේ දී ආතතිය ඇති කරන සාධක මග හැරීම ;

(ආ) සුක්කානම පාලනය, සාමාන්‍ය පරිදි රිය පැදවීම ආරම්භය, ඉදිරියට ගමන් කිරීම, නැවැත්වීම, නවතා තැබීම හා පසුපසට ධාවනය ;

(ඇ) බෑවුමක ධාවනය, වෙනත් වාහන පසු කිරීම සහ පසුකර යෑම ;

(ඈ) පිටුපසට ධාවනය කිරීමේ ගියරය භාවිතා කරමින් වමට සහ දකුණට සීමිත ඉඩකඩ ඇති ස්ථානයක් තුළට වාහනය පිටුපසට පැදවීම ;

(ඉ) ඉදිරිපස සහ පසුපස ගියරය භාවිතා කරමින් ප්‍රතිවිරුද්ධ දිශාවට මුහුණලා මාර්ගයක වාහනය රවුමට ආපසු හැරවීම ;

(ඊ) වංගුවක දී වාහනය හැසිරවීම සහ වේගය වැඩි කිරීමේ, තිරිංග යෙදීමේ, හදිසි තිරිංග යෙදීමේ බලපෑම සහ රෝද අගුලු නොවැටෙන ආකාරයට තිරිංග තද කිරීමේ ක්‍රමවේදය ;

(උ) නිවැරදිව ධාවන පථය අනුගමනය කිරීමේ ශික්ෂණය සහ නිවැරදිව වාහනය ස්ථාන ගත කිරීම ;

(ඌ) සියලු ආකාරයේ මංසන්ධි සහ වටරවුම් වලට නිවැරදිව ප්‍රවේශ වීම සහ හුවමාරුවීම ;

(එ) වාහන තදබදය, පදික මාරුව, දුම්රිය හරස් මාර්ග සහ අනතුරුදායක කලාප වල දී ඒ පිළිබඳ හඳුනාගැනීම සහ වාහන නිවැරදිව පාලනය කිරීම ; සහ

(ඒ) රාත්‍රී කාලයේ දී රිය පැදවීම.

ඉහත සඳහන් කරුණු පිළිබඳව අවම වශයෙන් පැය විස්සක ප්‍රායෝගික පුහුණුවක් ලබා දිය යුතු ය.

24. 1991 ජූනි මස 5 වන දින 665/6 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1990 මෝටර් වාහන (රිය පැදවීමේ පාසල් සහ රිය පැදවීමේ උපදේශක) නියෝග මෙයින් ඉවත් කරනු ලැබේ.

*I වන උපලේඛනය*

(3 වන නියෝගය)

එක් එක් රියදුරු බලපත්‍ර පංතිය සඳහා අදාළ රියදුරු පාසල් විසින් අයකරනු ලැබිය යුතු මූලික ගාස්තු

| | *රියදුරු පාසල් ප්‍රභේද* | *මෝටර් වාහන පංති* | *බලපත්‍ර වර්ගීකරණය* | *පුහුණු වන්නන්ගෙන් අයකළ යුතු මූලික ගාස්තු (රු.)* |
|---|---|---|---|---|
| 1. | ''ඒ'' ප්‍රභේදයේ රියදුරු පාසල් | මෝටර් සයිකලය<br>සැහැල්ලු මෝටර් සයිකලය<br>මෝටර් රථය<br>ද්විත්ව කාර්ය මෝටර් වාහනය<br>මෝටර් ට්‍රයිසිකලය<br>මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය<br>මෝටර් ලොරිය<br>සැහැල්ලු මෝටර් ලොරිය<br>බර මෝටර් ලොරිය<br>මෝටර් කෝච් රථය<br>සැහැල්ලු මෝටර් කෝච් රථය<br>බර මෝටර් කෝච් රථය<br>ඉඩම් වාහනය<br>අත් ට්‍රැක්ටරය<br>ආබාධිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන මෝටර් වාහනයක් | ඒ<br>ඒ 1<br>බී<br>බී<br>බී 1<br>බී 1<br>සී<br>සී 1<br>සීඊ<br>ඩී<br>ඩී 1<br>ඩීඊ<br>ජී<br>ජී 1<br>ජේ | |
| 2. | ''බී'' ප්‍රභේදයේ රියදුරු පාසල් | මෝටර් සයිකලය<br>සැහැල්ලු මෝටර් සයිකලය<br>මෝටර් රථය<br>ද්විත්ව කාර්ය මෝටර් වාහනය<br>මෝටර් ට්‍රයිසිකලය<br>මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය<br>මෝටර් ලොරිය<br>සැහැල්ලු මෝටර් ලොරිය<br>මෝටර් කෝච් රථය<br>සැහැල්ලු මෝටර් කෝච් රථය<br>ඉඩම් වාහනය<br>අත් ට්‍රැක්ටරය<br>ආබාධිත තැනැත්තන් විසින් භාවිතා කරනු ලබන මෝටර් වාහනයක් | ඒ<br>ඒ 1<br>බී<br>බී<br>බී 1<br>බී 1<br>සී<br>සී 1<br>ඩී<br>ඩී 1<br>ජී<br>ජී 1<br>ජේ | |
| 3. | ''සී'' ප්‍රභේදයේ රියදුරු පාසල් | මෝටර් සයිකලය<br>සැහැල්ලු මෝටර් සයිකලය<br>මෝටර් රථය<br>ද්විත්ව කාර්ය මෝටර් වාහනය<br>මෝටර් ට්‍රයිසිකලය<br>මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය<br>ඉඩම් වාහනය | ඒ<br>ඒ 1<br>බී<br>බී<br>බී 1<br>බී 1<br>ජී | |

*II වන උපලේඛනය*

(4 වන නියෝගය)

**රියදුරු පාසලක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා/එවැනි බලපත්‍රයක් අලුත් කිරීම සඳහා/බලපත්‍රලාභී රියදුරු පාසලක් අතිරේක ස්ථානගත කිරීමකට අනුමතය ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රය**

1. (අ) ඉල්ලුම්කරුගේ වාසගම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ..........
   (ආ) වෙනත් නම් : ..........

2. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය : ..........

3. (අ) ඉල්ලුම්කරුගේ උපන් දිනය : ..........
   (ආ) ආසන්නතම දිනයට වයස : ..........

4. රියදුරු පාසල් ප්‍රභේදය : ..........

5. රියදුරු පාසලේ නම සහ ලිපිනය : ..........

6. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ විස්තර :
   (i) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ..........
   (ii) දිස්ත්‍රික්කය : ..........
   (iii) පළාත : ..........

7. පවත්නා පහසුකම් (කරුණාකර ඉඩ ප්‍රදේශය වර්ග අඩි හෝ වර්ග මීටර වලින් සඳහන් කරන්න)
   (i) මෝටර් වාහනයක ආදර්ශයක් ප්‍රදර්ශනය කිරීමේ ක්‍රම සහිතව දේශන පැවැත්වීම සඳහා වූ පහසුකම් ;
   (ii) තාක්ෂණික පුහුණුව සඳහා වූ පහසුකම් ;
   (iii) වාහන නැවැත්වීමේ පහසුකම් ;
   (iv) පුහුණු පාඨමාලා සඳහා අය කරනු ලබන ගාස්තු ඇතුළත් දැන්වීම් ප්‍රදර්ශනය කිරීම.

8. අමුණා තිබිය යුතු ලේඛන :-
   (i) උප්පැන්න සහතිකයේ පිටපතක් ;
   (ii) ලියාපදිංචිය සඳහා/ලියාපදිංචිය ක්‍රියාත්මක වීම සඳහා ගෙවන ලද රු. .......... වූ ගාස්තු ගෙවීමේ රිසිට්පත ;
   (අදාළ නොවන වචන කපා හරින්න.)
   (iii) ඉල්ලුම් කරනු ලබන ප්‍රභේදය සඳහා පුහුණුව සඳහා භාවිතා කරනු ලබන වාහනවල ලියාපදිංචි අංක සහ වාහන පංතිය අන්තර්ගත ලැයිස්තුවක් ;
   (iv) බලපත්‍රලාභී රියදුරු උපදේශකවරුන්ගේ සහ සහකාර රියදුරු උපදේශකවරුන්ගේ නම් ලැයිස්තුවක් ;
   (v) I වන උපලේඛනයට අනුව පුහුණුව ලබන්නන්ගෙන් අයකළ යුතු ගාස්තු පිළිබඳ උපලේඛනයක් ;
   (vi) ව්‍යාපාර ලියාපදිංචියට අදාළ ලේඛන.

ඉහත සඳහන් තොරතුරු මාගේ උපරිම දැනීමට අනුව සියලු ආකාරයෙන් නිවැරදි බව මම ප්‍රකාශ කර සිටිමි.

.......... ..........
දිනය ඉල්ලුම්කරුගේ අත්සන

* ඉල්ලුම්පත්‍රය රියදුරු පාසලක බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන අවස්ථාවකදී, දැනටමත් භාර දී ඇති තොරතුරු සඳහා වූ වෙනස්කම් පමණක් ඉදිරිපත් කිරීමට නියමිත වේ.

සමාලෝචන මණ්ඩලයේ නිර්දේශය

පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව .......... පදිංචි .......... යන ඉල්ලුම්කරු වෙත .......... ප්‍රභේදය යටතේ රියදුරු පාසලක් පවත්වාගෙන යැම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය යුතු බවට/ප්‍රදානය කරනු නොලැබිය යුතු බවට නිර්දේශ කරමු.

බලපත්‍රය සඳහා නිර්දේශය නොලැබෙන අවස්ථාවකදී, ඒ සඳහා වූ හේතු පහත දක්වේ :-

| *නිර්දේශ කරමි/නොකරමි* | *නිර්දේශ කරමි/නොකරමි* | *නිර්දේශ කරමි/නොකරමි* |
|---|---|---|
| නම | නම | නම |
| අත්සන | අත්සන | අත්සන |
| දිනය | දිනය | දිනය |

*III වන උපලේඛනය*

(15 වන සහ 20 වන නියෝග)

රියදුරු උපදේශක බලපත්‍රයක් / සහකාර රියදුරු උපදේශක බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය

1. (*අ*) ඉල්ලුම්කරුගේ වාසගම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ..........
   (*ආ*) වෙනත් නම් : ..........

2. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය : ..........

3. රියදුරු පාසලේ නම සහ ලිපිනය : ..........

4. ඉල්ලුම්කරුගේ වයස හා උපන් දිනය :

   (*අ*) වයස : .......... (*ආ*) උපන් දිනය : ..........

5. අධ්‍යාපන සුදුසුකම් : ..........

6. පළපුරුද්ද (සනාථ කිරීමේ ලේඛන අමුණන්න) : ..........

7. අමුණා තිබිය යුතු ලේඛන :-

   (*අ*) උප්පැන්න සහතිකයේ පිටපත
   (*ආ*) වෛද්‍ය සහතිකය
   (*ඇ*) රියදුරු බලපත්‍රයේ පිටපත
   (*ඈ*) අධ්‍යාපන සහතිකවල පිටපත්
   (*ඉ*) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික වල පිටපත්
   (සහකාර රියදුරු උපදේශකවරුන් සඳහා පමණි)
   (*ඊ*) ග්‍රාම නිලධාරී විසින් නිකුත්කරනු ලබන චරිත සහතිකය
   (*උ*) පොලිස් සහතිකය
   (*ඌ*) ලියාපදිංචි රියදුරු පාසලෙන් නිකුත් කරනු ලබන ලිපිය (සහකාර රියදුරු උපදේශක බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරන ඉල්ලුම්කරුවන්ට පමණක් අදාළ වන අතර EPF සහ ETF ගෙවීම් පිළිබඳ ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.)
   (*එ*) අදාළ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මෝටර්වාහන පරීක්ෂක විසින් නිකුත් කරනු ලබන සහතිකයේ පිටපත (සහකාර රියදුරු උපදේශක බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරනු ලබන ඉල්ලුම්කරුවන් සඳහා පමණක් අදාළ වේ) ; සහ
   (*ඒ*) මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබූ රු.  /- ක් වූ ලියාපදිංචිය ඉල්ලුම් කිරීමේ ගාස්තුවේ රිසිට්පත.

ඉහත සඳහන් තොරතුරු මාගේ උපරිම දැනීමට අනුව සියලු ආකාරයෙන් නිවැරදි බව මම ප්‍රකාශ කර සිටිමි.

.......................... ..........................
දිනය ඉල්ලුම්කරුගේ අත්සන

11 - 394

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.